*II වැනි කොටස*

I වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් සේවකයින්ට සාමාන්‍ය වැඩ කරන දිනයක් සඳහා කාල මිම්මේ වැඩ වෙනුවෙන් ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි දක්වා ඇති ප්‍රමාණයන් විය යුතු ය.

***කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය***

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| *සේවකයින්ගේ පන්තිය* | *වැඩකරන සාමාන්‍ය දවසකට මූලික වේතන ප්‍රමාණය රු. ශත* |
| *පොළොව යට වැඩකරන්නෝ :* | |
| බෝර ගසන්නෝ (අතින් සහ යන්ත්‍රවලින්) | 882.00 |
| ගල් පුපුරවන්නෝ | 882.00 |
| කණු බස්සවන්නෝ | 882.00 |
| ලෑලි ගසන්නෝ | 882.00 |
| පස් අරන් දමන්නෝ (සාරන්නෝ) | 882.00 |
| මඩ අරන් දමන්නෝ | 688.80 |
| ඩක්කුකරුවෝ | 688.80 |
| මුර කංකානම්වරු | 915.60 |
| ඕවර්සියර් සහ කංකානම්වරු | 974.40 |
| බාස්වරු | 1,176.00 |
| පටවන්නෝ | 974.40 |
| නුපුහුණු කම්කරුවෝ | 688.80 |
| ඔන්සේටර්වරු නොහොත් දෝනකටකරුවෝ | 974.40 |
| *පොළොව යට හා මතුපිට වැඩකරන්නෝ :* | |
| යාන්ත්‍රික වැඩකරුවෝ, ෆිටර්වරුන් හා විදුලි කම්කරුවෝ | 1,075.20 |
| යාන්ත්‍රික වැඩකරුවන්ගේ, ෆිටර්වරුන්ගේ හා විදුලි කම්කරුවන්ගේ අත් උදව්කරුවෝ | 688.80 |
| ගොඩ එවන්නෝ සහ ගොඩ දමන්නෝ | 1,075.20 |
| දබරකරුවෝ | 688.80 |
| වෙකර්වරු | 974.40 |
| පොම්පකරුවෝ | 1,075.20 |
| ඇන්ජින් එළවන්නෝ | 1,075.20 |
| *මතුපිට වැඩකරන්නෝ :* | |
| නුපුහුණු කම්කරුවෝ | 537.60 |
| යකඩ කම්මල්කරුවෝ | 882.00 |
| ඩ්‍රිල් මුවහත්කරුවෝ | 882.00 |
| කම්මල් වැඩ කරන පිරිමි ළමයි | 588.00 |
| බොයිලේරු කම්කරුවෝ | 882.00 |
| වඩුරාළලා | 1,075.00 |
| පෙදරේරුවෝ (මේසන්ලා) | 1,075.00 |
| කරත්තකරුවෝ | 688.80 |
| මුරකරුවෝ | 688.80 |
| ඕවර්සියර්වරු | 974.40 |
| දර අදින්නෝ සහ දර පලන්නෝ | 722.40 |
| කෑම පිසින්නෝ | 588.00 |
| බක්කිකරුවෝ නොහොත් බැන්ක්ස්මන්වරු | 879.20 |

